රත්තොට ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 19 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 02 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට රත්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි 05 ක, ලීබඩු හා කාර්යාල උපකරණ 06 ක හා වාහනයක වටිනාකම වූ රු.15,248,801 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමට පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද මුදලින් වැය නොකළ රු.1,341,166 ක මුදල එම අමාත්‍යාංශයට නැවත ප්‍රේෂණය කිරීමේදී ණය හිමි ශේෂයට ගැලපුම් නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම වැඩියෙන් දැක්වුණි.

(ඇ) ලැබියයුතු මුද්දර ගාස්තු ආදායම රු.4,189,208 ක්, ප්‍රාග්ධන ආධාර රු.3,419,291 ක් හා ප්‍රාග්ධන වියදම් රු.924,426 ක් අඩුවෙන් දැක්වුණි.

(ඈ) ගොඩනැඟිලි 06කට හා පුස්තකාල පොත්වලට අදාලව එකතු වටිනාකම රු.1,475,287 ක්වූ ශේෂයක් වැඩියෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවියයුතු දායක මුදල වූ රු.78,094 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඊ) අය ශීර්ෂ 2 කට අදාල එකතුව රු.2,002,950ක්වූ පුනරාවර්තන ආදායම් වැඩියෙන් දැක්වුණි.

(උ) 2015 ජුලි 03 දිනැති අංක සීඑල්/එම්එල්/බී/ආර්පීඑස්/05/14/38 දරන විගණකාධිපති වාර්තාවේ 2.2.1 ඡේදයෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.24,201,851 ක්වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.367,665 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

---------------------

වසර 18ක සිට අවලව ඉදිරියට ගෙන එමින් පවතින රු.15,462 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

----------------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 10 ක එකතුව රු.28,839,421 ක්වූ අතර, වසර 05කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.1,744,225ක් වූ ශේෂයක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

----------------------

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 04 ක එකතුව රු.20,293,580 ක්වූ අතර, වර්ෂ 05කට වැඩි කාලයක් ඉක්මවූ රු.2,144,087 ක් වූ ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

ගිණුම් විෂයයන් 06 කට අදාළ ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.102,728,372 ක්වූ ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.7 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219(i) වගන්තිය | රත්තොට ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා විසින් තමා සාමාජිකත්වය දරන රත්තොට සමෘද්ධි නිලධාරීන්ගේ සුභ සාධක සමිතිය වෙත වටිනාකම රු.1,392,355 ක් වූ කොන්ත්‍රාත් 15ක් පවරා දීමට කටයුතු කර තිබුණි. |
| (ආ). | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 1987 න් පසු ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 756 | 2015 වර්ෂය සඳහා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ, ගබඩා භාණ්ඩ හා ආයුර්වේද තොගය සම්බන්ධයෙන් සමීක්ෂණයක සිදු කර නොතිබුණි. |
| (ඈ) | ජනාධිපති ලේකම්ගේ 2010 පෙබරවාරි 03 දිනැති අංක එස්පී/ආර්ඩී/02/10 දරන රජයේ ඉඩම් කළමනාකරණය මැයෙන් වූ චක්‍රලේඛයේ 3.5 ඡේදය | පළාත් පාලන ආයතන වෙත පවරා ඇති ඉඩම්වල භුක්තිය විඳීමේ අයිතිය පළාත් පාලන ආයතන සතු බව, ඉඩම්වල පරම අයිතිය රජය සතු බව හා එවැනි ඉඩමක් තෙවන පාර්ශවයකට බැහැර කළ නොහැකි බව, දක්වා තිබුණද ඊට අනුකූල නොවී සභා දේපලවල අනවසර කඩ කාමර 2 ක් ඉදිකිරීමට ඉඩහැර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,254,378 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,540,055 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,714,323ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 වරිපනම් බදු
--------------

2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.795,607 ක් වූ අතර, එම ශේෂය තුල වසර 01 සිට 05 දක්වා කාලයට අයත් රු.779,748 ක ශේෂ ඇතුළත්වී තිබුණි.

2.2.2 අක්කර බදු
---------------

හිඟහිටි අක්කර බදු ශේෂය රු.327,814 ක් වූ අතර, එම ශේෂය තුල වර්ෂ 01 සිට 05 දක්වා කාලයට අයත් රු.287,449 ක ශේෂ ඇතුළත්වී තිබුණි.

2.2.3 ජල ගාස්තු
-------------

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.5,445,708ක හිඟ ශේෂයෙන් වර්ෂය තුල රු.2,312,546 ක මුදලක් පමණක් අයකරගෙන තිබූ අතර, එය මුළු හිඟයෙන් සියයට 42 ක අගයක් විය. වර්ෂය අවසානයට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.5,902,553 ක් තරම් ඉහළ අගයක් විය.

(ආ) 2015 වර්ෂය වන විට ජල පාරිභෝගිකයින් 3777කට ජලය බෙදාහැර තිබුණු අතර, ඉන් ජල මනු සවිකර තිබුණේ පාරිභෝගිකයින් 52 කට පමණි. ඉතිරි පාරිභෝගිකයන් 3725 දෙනෙකුගෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකොට මාසිකව රු.200, රු.300, රු.500, රු.750 හා රු.1,200 ක් ලෙස පදනමකින් තොරව ගාස්තු අයකර තිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

--------------------

වර්ෂ 4 ක කාලයක සිට පැවත එන හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.408,685 ක් විය.

2.2.5 බදු කුලී

---------

හිඟහිටි බදු කුලී ශේෂය රු.594,548 ක් වූ අතර, එම ශේෂය තුල වර්ෂයකට වැඩි රු.459,702 ක හිඟහිටි ශේෂයක් ඇතුළත්වී තිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.6,973,995ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,967,565 ක මුදලක් අයවිය යුතුව තිබුණි. හිඟ මුද්දර ගාස්තු අයවී ඇති බව 2016 ජූලි 07 දාතමින් ලේකම්වරයා ඒ වෙත වාර්තා කර තිබුණි.

2.3 අධිභාර

---------

1987 අගෝස්තු 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂවලදී පනවන ලද අධිභාරවලට අදාලව රු.10,220,657ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් 152 කින් ඉඩම් 06 කට පමණක් පැවරුම් නියෝග ලබාගෙන තිබූ අතර, සියළු ඉඩම් සඳහා නීත්‍යානුකූල ඔප්පු ලබාගෙන අයිතිය තහවුරු කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව ස්ථාන මාරුවී ගිය, සේවය හැරගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.435,073 ක්වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ණයගැති ශේෂය තුල වූ 2000 වර්ෂයේ සිට 2013 දක්වා කාලයට අදාලව පැවැති රු.2,624,047 ක ශේෂ නිරවුල් කරගෙන නොතිබුණි.

(ඈ) 1999 වර්ෂයේ සිට 2013 දක්වා කාලයට අදාල නොපියවූ අත්තිකාරම් ශේෂය වූ රු.414,687 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි .

(ඉ) ණයහිමි ශේෂය තුලවූ 2006 වර්ෂයේ සිට 2013 දක්වා කාලයට අදාල රු.5,541,919ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2014 වර්ෂයේ ප්‍රාදේශීය සභා පොදු අරමුදල් යටතේ රු.1,539,878 ක් වැයකර ජනක බණ්ඩාර තෙන්නකෝන් මාවතේ ඉදිකර තිබුණු කඩ කාමර 07 ක් විධිමත් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව පුද්ගලයන් වෙත ලබාදී තිබුණි.

(උ) සභාවේ ආදායම් පරිපාලක තනතුරෙහි පුරප්පාඩු නොතිබියදී සියයට 40 ක කොමිස් ගෙවීමේ පදනමට සේවකයෙකු බඳවාගෙන රු.71,691ක කොමිස් මුදලක් ගෙවා තිබුණි.

(ඌ) අතිරික්ත සේවකයින් 21 දෙනෙකු රාජකාරිවල යොදවා තිබුණු අතර, දෛනික වැටුප් හා දීමනා ගෙවීම මත සේවකයින් 07 දෙනෙකු සේවයේ යෙදවීම හා අනුමත නොවූ තනතුරු සඳහා සේවකයින් 04 දෙනෙකු බඳවාගෙන ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමද සිදුකර තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

සංවර්ධන කටයුතු අධීක්ෂණය සඳහා සභා මන්ත්‍රීවරුන්ට යතුරුපැදි ලබාදීමේ වැඩසටහන යටතේ මන්ත්‍රීවරු 05 දෙනෙකුට ලබාදීතිබූ එකතුව රු.250,000 ක ණය මුදල ඔවුන්ගේ මාසික දීමනාවලින් අඩුකර ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය
--------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) භාවිතයට ගත නොහැකි රු.1,661,900 ක් වටිනා වාහන 9 ක් වෙන්දේසි කිරීමට හෝ අළුත්වැඩියා කර භාවිතයට ගැනිමට කටයුතු කර නොතිබුණු අතර, භාවිතයෙන් ඉවත්කල රු.213,000 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර 2 ක් හා රු.106,000 ක් වටිනා රෝනියෝ යන්ත්‍රයක් සුදුස්සක් කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ රත්තොට මාතලේ ප්‍රධාන මාර්ගය පුළුල් කිරීමේදී අළුතින් ජලනල සවිකිරීම සඳහා රු.1,950,000 ක් වටිනා ජලනල උපකරණ මිලදීගෙන තිබුණු අතර, ඉන් රු.451,240 ක උපකරණ භාවිතයට නොගෙන සම්මන්ත්‍රණ ශාලා ගොඩනැගිල්ලේ ගොඩ ගසා තිබුණි.

3.4 අවිධිමත් ගණුදෙනු
--------------------

ප්‍රාදේශීය සභා නියෝජිතයින්ගේ ධූර කාලය 2015 මැයි 15 දිනෙන් අවසන් වී තිබූ නමුත්, මැයි මාසය සඳහා මන්ත්‍රී ඉන්ධන දීමනාව සම්පූර්ණයෙන් ගෙවා තිබීම නිසා රු.12,500 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.5 හඳුනාගත් පාඩු
-----------------

1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10(I) හා (2) වගන්ති ප්‍රකාරව සේවක අර්ථසාධක දායක මුදල් අරමුදලට යැවිය යුතු වුවත්, 2001 – 2012 කාලපරිච්ඡේදයට අදාලව දායක මුදල් යැවීම ප්‍රමාදවීම හේතුවෙන් රු.79,587 ක් අධිභාර ගෙවා තිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන ටොන් 2 ක පමණ අපද්‍රව්‍ය සභාවේ ට්‍රැක්ටර් 2 ක් හා සේවකයින් 07 දෙනෙකු යොදවා එකතු කර, එයින් වෙන් කරන ලද ඝන අපද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 600 ක ප්‍රමාණයක් ගොඩ ක්‍රමය මඟින් දිරාපත් වූ පසු කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා යොදාගෙන තිබුණි. එකතු කරන ලද කසල ප්‍රමාණයෙන් කොම්පොස්ට් නිෂ්පාදනය සඳහා යොදා නොගන්නා සියයට 40 ක පමණ ප්‍රමාණයක් පරිසරයට හානි වන අයුරින් බැහැර කර තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුල අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, පහත විස්තර දැක්වෙන පරිදි සැලකියයුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 04 ක සියයට 36 සිට සියයට 97 දක්වා පරාසයක ඉලක්කගත ආදායම් උපයාගෙන නොතිබුණු අතර, තවත් ආදායම් විෂයයන් 13 ක ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා සියයට 52 සිට සියයට 664 දක්වා වූ පරාසයක විචලනයන් පැවතුණි.

(ආ) වැය විෂයයන් 15 ක් සඳහා වූ රු.2,864,772 ක සම්පූර්ණ ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉතිරිකර තිබුණු අතර, තවත් වැය විෂයයන් 27 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර, සියයට 40 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

1988 (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) මානව සම්පත් කළමනාකරණය